කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

**GENERAL WEATHER FORECAST FOR SRI LANKA**

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.

Issued by Forecasting Division, National Meteorological Centre.

**2021 ජනවාරි මස 04 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2021 ජනවාරි මස 03 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

ශ්‍රී ලංකාව ආශ්‍රිත වායුගෝලයේ පවතින තරංගාකාර කැළඹිලි ස්වභාවය හේතුවෙන් දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල වැසි තත්ත්වයේ වැඩිවීමක් ඉදිරි දින කිහිපයේදී (අද දින සිට) බලාපොරොත්තුවේ.

උතුරු, නැගෙනහිර, උතුරු-මැද, ඌව සහ මධ්‍යම පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. නැගෙනහිර සහ ඌව පළාත්වලත් පොළොන්නරුව, මාතලේ, නුවරඑළිය සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී. 100 පමණ තද වැසි ද ඇතිවිය හැක.

සෙසු ප්‍රදේශවල ප.ව. 1.00 න් පමණ පසුව තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. සබරගමුව සහ බස්නාහිර පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී. 75 ට වැඩි තරමක් තද වැසි ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං සහ අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

**WEATHER FORECAST FOR 04 JANUARY 2021**
**Issued at 12.00 noon on 03 January 2021**

**Showery weather over the Northern and Eastern parts of the island is expected to enhance due to the wavy type atmospheric disturbance in the vicinity of Sri Lanka, during next few days, starting from today.**

Showers or thundershowers will occur at times in Northern, Eastern, North-central, Uva and Central provinces and in Hambantota district. Heavy showers about 100 mm can be expected at some places in Eastern and Uva provinces and in Polonnaruwa, Mathale, Nuwara-Eliya and Hambantota districts.

Showers or thundershowers will occur at several places elsewhere after 1.00 p.m. Fairly heavy showers above **75 mm** can be expected at some places in Sabaragamuwa and Western provinces and in Galle and Matara districts.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
**2021 ජනවාරි මස 03 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

| වැසි තත්ත්වය: |
| --- |
| කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි ඇති වේ. මෙම මුහුදු ප්‍රදේශයේ ඇතැම් ස්ථාන වලට තද වැසි ද ඇති විය හැක.<br>සෙසු මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. |
| සුළඟ: |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ. කොළඹ සිට පුත්තලම හරහා කන්කසන්තුරය දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-55) දක්වා වැඩිවන අතර සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 50 දක්වා ඉහළ යාමට හැකියාවක් පවතී. |
| මුහුදේ ස්වභාවය: |
| කොළඹ සිට පුත්තලම හරහා කන්කසන්තුරය දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක. සෙසු මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක. |

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS

**Issued at 12.00 noon on 03 January 2021**

| **Condition of Rain:** |
| --- |
| Showers will occur at times in the sea areas extending from Kankasanthurai to Hambantota via Trincomalee. Heavy showers can be expected at some places in these sea area.<br>Showers or thundershowers will occur at a few places in the other sea areas around the island, in the evening or night. |
| **Winds:** |
| Winds will be North-easterly in the sea areas around the island and wind speed will be(30-40) kmph. Wind speed can increase up to **(50-55) kmph** at times in the sea areas extending from Colombo to Kankasanthurai via Puttalam. Wind speed can increase up to **50 kmph** at times in the other sea areas around the island. |
| **State of Sea:** |
| The sea area extending from Colombo to Kankasanthurai via Puttalam can be rough at times. Other sea areas around the island can be fairly rough at times. |

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි